මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகமகல்விக்வலயம்மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

බුද්ධ ධර්මය I	11 ශ්‍රේණිය	කාලය :පැය 01 යි

★ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 1 - 40 තෙක් පශ්නවලට වඩාත්ම නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

(01) බුදුරජුන් තම සසුනේ ශ්‍රාවකයින්ට තනතුරු ප්‍රදානය කිරීමේදී මූලික වශයෙන් සොයා බලන ලද්දේ,

1) කුලය ගැනය 2) ධනවත්කම ගැනය 3) ඥාතීත්වය ගැනය 4) කුසලතාවය ගැනය

(02) බුදුරජාණන් වහන්සේ බොහෝ දුෂ්කරතා දරාගෙන සිව්මසක් වාසය කළේ,

1) කිඹුල්වත්පුරය 2) කපිලවස්තුපුරය 3) වේරංජනා නුවරය 4) සැවැත්නුවරය

(03) බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනය පැවැත්වූයේ,

1) බරණැස් නුවරය 2) සැවැත් නුවරය 3) පැලලුප් නුවරය 4) රජගහ නුවරය

(04) කෙලෙහිගුණ දැක්වීමේ මහඟු ආදර්ශය බුදුරජාණන් වහන්සේ ලෝකයාට ලබා දුන්නේ,

1) පළමු සතියේදීය 2) දෙවන සතියේදීය 3) තෙවන සතියේදීය 4) සිව්වන සතියේදීය

(05) " මම සසර දුකට මුල්වන පංචස්කන්ධය නමැති ගෙය හදන වඩුවා දිටිමි. නොයෙක් ජාතිවල ඇවිද්දෙමි. ඒත් දැන් වඩුව දිටිමි." යන ප්‍රකාශය බුදුරජාණන් වහන්සේ සිදු කළේ,

1) බුද්ධත්වයට පත්වීමෙන් පසුවය
2) ඉපදීමෙන් පසුවය
3) මංගල ධර්මදේශනයෙන් පසුවය
4) පරිනිර්වාණයට පත්වන අවස්ථාවේදීය

(06) ශිෂ්‍ය ජීවිතයේ සාර්ථකත්වය උදෙසා හේතුවන කරුණක් ලෙස පෙන්වා දිය හැකි වන්නේ,

1) කුසීතකම 2) තරුණ මදයයි 3) උත්සාහයයි 4) හිතුවක්කාරකමයි

(07) බෞද්ධ ඉගැන්වීම්වලට අනුව ලාභ - අලාභ යස - අයස ආදී කරුණු හැඳින්වෙන්නේ,

1) ලෝකපාලක ධර්ම ලෙසයි
2) අත්තාධිපති ධර්ම ලෙසයි
3) අෂ්ටලෝක ධර්ම ලෙසයි
4) ලෝකාධිපති ධර්ම ලෙසයි

(08) බුදුරජාණන් වහන්සේ ඇඩිව ගිලන් වූ පූතිගත්තතිස්ස හිමියන්ට උවටැන් කොට දේශනා කළ පාඨය වන්නේ,

1) "නීරෝගීකම උතුම්ම ලාභයයි" යන්නයි
2) "තණ්හාව බරපතලම රෝගය" යන්නයි
3) "ගිලනුන්ට උපස්ථාන කරන්නා බුදුරජාණන් වහන්සේට උපස්ථාන කරන්නෙකි" යන්නයි
4) "සියළුම පෘතග්ජනයෝ උන්මත්තකයෝ "යන්නයි

(09) බුදුරජාණන් වහන්සේගේ පුරුසදම්ම සාරථී ගුණය මතු කරන අවස්ථාවකට උදාහරණයකි,

1) චිංචිමානවිකාවගේ කථා පුවත
2) පටාචාරාගේ කථා පුවත
3) මාගන්දියාගේ කථා පුවත
4) ආලවක යක්ෂයාගේ කථා පුවත

(10) තෘෂ්ණාව, මාන හා වැරදි දෘෂ්ඨිය ආදියෙන් තොරව කරුණාව හා උපාය කුසලතාව ආදියෙන් යුක්තව සිදුකරන දානාදී පුණ්‍ය කර්ම හඳුන්වනු ලබන නම,

1) රාජධර්ම ලෙසය 2) ලෝකාධිපති ධර්ම ලෙසය 3) අත්තූපනායික ධර්ම ලෙසය 4) පාරමිතා ධර්ම ලෙසය

(11) තමන්ගේ ජීවිතයද පරිත්‍යාග කරමින් පෙරුම්දම් පිරීම හඳුන්වන්නේ,

1) පාරමී ලෙසය 2) උපපාරමී ලෙසය 3) දස පාරමී ලෙසය 4) පරමත්ථ පාරමී ලෙසය

(12) අප මහා බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පුගුණ කළ ආකාරය හෙළිවන ජාතකය වන්නේ,

1) වට්ටක ජාතකය 2) මඛාදේව ජාතකය 3) මසමානවක ජාතකය 4) තේමිය ජාතකය

(13) පාරමිතා සම්පූර්ණ කරන ආකාරය අනුව සෑම පාරමිතාවක්ම කොටස් තුනකට බෙදේ. ඒවා,

1) පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී ලෙස හඳුන්වයි.

2) බුදු, පසේ බුදු, මහරහත් ලෙස හඳුන්වයි.

3) තෘෂ්ණා, මාන, දෘෂ්ඨි ලෙස හඳුන්වයි.

4) ස්වාර්ථ, පරාර්ථ, උභයාර්ථ ලෙස හඳුන්වයි.

(14) "දූරං ගමං ඒකචරං - අසරීරං ගුහා සයං"..... යන ගාථාවෙන් විස්තර වන්නේ,

1) ශරීරය ගැනය 2) සිත ගැනය 3) මාරයා ගැනය 4) දුර ගැනය

(15) සිත සංවර කර ගැනීමට බාධා කරන කරුණු පංච නීවරණ ධර්ම ලෙස හඳුන්වන අතර බුද්ධාදී අටතැන්හි, සිතේ ඇතිවන සැකය හෙවත් වැනෙන සුළු ගතිය,

1) ව්‍යාපාද නමින් හැඳින්වේ 2) විචිකිච්ඡා නමින් හැඳින්වේ

3) ථීනමිද්ධ නමින් හැඳිනවේ 4) උද්ධච්ච - කුක්කුච්ච නමින් හැඳින්වේ

(16) විවිධ අරමුණු කරා ගමන් කරන, නිතර වෙනස් වන, චංචල සිත සමාධිගත කර ගැනීමට පමණක් ඉවහල් වන භාවනා ක්‍රමය,

1) සමථ නමින් හැඳින්වේ 2) විදර්ශනා නමින් හැඳින්වේ

3) ව්‍යතික්‍රම නමින් හැඳින්වේ 4) අප්‍රාණක ධ්‍යාන නමින් හැඳින්වේ

(17) අතිපූජ්‍ය රේරුකානේ චන්දවිමල මහනාහිමි විසින් බෞද්ධ ජීවිතයක් හොඳින් ගත කරන ආකාරය විස්තර කෙරෙන ග්‍රන්ථයකි.

1) ධර්ම විනිශ්චය 2) බෞද්ධයාගේ අත්පොත 3) පාරමිතාප්‍රකරණය 4) පොහොය දිනය

(18) පරම විඥානාර්ථ නම් බෞද්ධ සමාගම පිහිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ පුවත්පත වනුයේ,

1) සරසවි සඳරුසයි 2) සිංහල බෞද්ධයායි 3) ලංකාදීපයයි 4) ලක්කිරණයි

(19) එංගලන්තයේ ලන්ඩන් බෞද්ධ මධ්‍යස්ථානය, බරණැස මූලගන්ධකුටි විහාරය ආදී බෞද්ධ ගොඩනැගිලි ඉදිකරනු ලැබුවේ,

1) හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා විසින් 2) ධර්මපාලතුමා විසින්

4) දොන් කරෝලිස් හේවාවිතාරණ විසින් 4) බිලැන්කට් මැතිණිය විසින්

(20) ධම්මපදය නම් ග්‍රන්ථය සූත්‍ර පිටකයේ කුමන නිකායට අයත්වේද?

1) අංගුත්තර නිකායටය 2) මජ්ජිම නිකායටය 3) සංයුක්ත නිකායටය 4) ඛුද්ධික නිකායටය

(21) "අසවලා මට බැන්නේය. මට පහර දුන්නේය. මා පැරදවූවේය"...... යනාදී අදහස් ඇතුළත් ධම්මපද ගාථාව වන්නේ,

1) තංච කම්මන් කතං සාධු .... යන ගාථාවයි

2) අත්තනාව කතං පාපක .... යන ගාථාවයි

3) අක්කොච්ජිමං අවධිමං .... යන ගාථාවයි

4) සුකරාණි අසාධූනි .... යන ගාථාවයි

(22) දස අකුසල් අතරට ගැනෙන දැඩි ලෝභය හඳුන්වනු ලබන්නේ,

1) ව්‍යාපාද ලෙසිනි 2) මිත්‍යාදෘෂ්ටිය ලෙසිනි 3) අභිධ්‍යාව ලෙසිනි 4) මච්ඡරිය ලෙසිනි

(23) කුසල් කිරීමට මුල් වන චේතනා තුන,

1) ලෝභ, දෝස, මෝහ යි
2) සිත, කය, වචනය යි
3) අලෝභ, අදෝස, අමෝහ යි
4) දාන, සීල, භාවනා යි

(24) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීමට හේතුවන කරුණු අතරට අයත් වනුයේ,

1) ආරක්ඛ සම්ප්‍රදායි වේ
2) සද්ධා සම්ප්‍රදායි වේ
3) සීල සම්ප්‍රදායි වේ
4) ත්‍යාග සම්ප්‍රදායි වේ

(25) කෙනෙක් ධර්මානුකූලව උපයා ගත් ධනය තම ආදායමට අනුව වැය කරමින් මධ්‍යස්ථ ජීවිතයක් ගත කිරීමට පුරුදු වී සිටිති. එසේ ජීවිතය ගත කිරීම,

1) උට්ඨාන සම්ප්‍රදා නමින් හැඳින්වේ
2) ආරක්ඛ සම්ප්‍රදා නමින් හැඳින්වේ
3) කල්‍යාණමිත්තතා සම්ප්‍රදා නමින් හැඳින්වේ
4) සමජීවිකතා නමින් හැඳින්වේ

(26) "ඵුට්ඨස්ස ලෝක ධම්මේහි - චිත්තං යස්සන කම්පති" .... යන ගාථා පාඨයෙන් පැහැදිලි වන්නේ,

1) ලෝකයේ ඇලී ගැලී නොසිටිය යුතු බවයි

2) සිත අකෝප්‍යව තබා ගත යුතු බවයි

3) ගැටුම්වලින් තොරව සාමකාමීව ජීවත් වීමේ වටිනාකමයි

4) අටලෝදහමින් නොසැලී සිටිය යුතු බවයි

(27) ධර්මයට අකමැති වීම, අසත්පුරුෂයන් ප්‍රිය වීම, සත්පුරුෂයන් ප්‍රිය නොකිරීම, අසත්පුරුෂය ධර්මය ප්‍රිය කිරීම ආදී කරුණු ඇතුළත් සූත්‍ර ධර්මය වන්නේ,

1) මහා මංගල සූත්‍රයේය 2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේය 3) පරාභව සූත්‍රයේය 4) සිඟාලෝවාද සූත්‍රයේය

(28) පුද්ගලයෙකුට සිතීමේ හා විමසීමේ නිදහස අගය කරමින් බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර ධර්මය වනුයේ,

1) වීමංසක සූත්‍රයේය 2) කාලාම සූත්‍රයේය 3) චංකි සූත්‍රයේය 4) මහා මංගල සූත්‍රයේය

(29) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් සතර සංග්‍රහ වස්තු හඳුනා ගන්න.

1) දානය, ප්‍රිය වචනය, අර්ථචරියාව, සමානාත්මතාවය

2) දානය, ශීලය, ප්‍රිය වචනය, අර්ථචරියාව

3) දානය, ශීලය, නෙක්ඛම්ම, ප්‍රඥාව

4) දානය, ශීලය, ප්‍රිය වචනය, ප්‍රඥාව, සමානාත්මතාවය

(30) චුල්ලකම්ම විභංග සූත්‍රයේ සඳහන් පුද්ගල විෂමතා පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ කාහටද?

1) තෝදෙය්‍ය පුත්‍ර සුභ මානවකයාට   2) දීඝජානුකෝළිය පුත්‍රයාට

3) සිඟාල ගෘහ පුත්‍රයාට   3) උපාලි ගෘහ පුත්‍රයාට

(31) චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව සත්ත්ව හිංසාව සිදු කරන්නා ඊළඟ භවයේදී ද?

1) බොහෝ ආබාධ සහිතව උපදී   2) දුර්වර්ණව උපදී   3) අඩු වයසින් මිය යයි 4) ප්‍රඥාව අඩුව උපදී

(32) බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇති පරිදි අනුන්ගේ සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා,

1) නීරෝගී වේ   2) පොහොසත් වේ   3) තේජස් ඇත්තෙක් වේ   4) නුවණැත්තෙක් වේ

(33) "මෙය ඇති කල්හි මෙය වේ. මෙය නැති කල්හි මෙය නොවේ." (ඉමස්මිං සති ඉදංහෝති, ඉමස්මිං අසති ඉදංහෝති) යන මෙම ධර්ම පර්යාය බුදු දහමේ හැඳින්වෙන්නේ,

1) පුබ්බේකත හේතුවාදය නමිනි   2) පටිච්චසමුප්පාදය නමිනි

3) අහේතුඅප්පච්චයතිවාදය නමිනි   4) ඉස්සරනිම්මානවාදය නමිනි

(34) චතුරාර්ය සත්‍යය නොදැනීම හේතුකොට ගෙන කුසලාකුසල කර්ම රැස් කිරීම යන්න ප්‍රකාශ වන්නේ,

1) අවිජ්ජා පච්චයා සංඛාරා මඟිනි   2) සංඛාර පච්චයා විඤ්ඤාණ මඟිනි

3) විඤ්ඤාණ පච්චයා නාමරූපං මඟිනි   4) තණ්හා පච්චයා උපාදානං මඟිනි

(35) බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව දිවා රාත්‍රී පිං වැඩෙන කුසල ක්‍රියා ගනයට අයත් නොවන්නේ,

1) මල් පළතුරු උයන් වගා කිරීමයි   2) ස්වාභාවික වනාන්තර ආරක්ෂා කිරීමයි

3) ඒදඬු පාලම් පැන්හල් පොකුණු තැනීමයි   4) තෝරා ගත් වෘක්ෂ වන්දනා කිරීමයි

(36) භද්දාලි සූත්‍රයෙහි දැක්වෙන පරිදි ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීමෙන් ලැබෙන යහපත් ප්‍රතිඵලයක් නොවන්නේ,

1) රෝගාබාධ අඩු වීමයි   2) සුවපහසු පැවැත්මයි 3) කාය බලය ලැබීමයි 4) මානසික බලය ලැබීමයි

(37) උපතිස්ස පිරිවැජියාට ඇසූ ප්‍රශ්නයට පිළිතුරු ලෙස "යේ ධම්මා හේතුප්පභවා තේසං හේතු තථාගතෝ ආහ" යනාදී ගාථාව ප්‍රකාශ කළේ,

1) කොණ්ඩඤ්ඤ හිමිය   2) භද්දිය හිමිය   3) මහානාම හිමිය   4) අස්වජි හිමිය

(38) නිවන් පසක් කිරීමට අවශ්‍ය මනා වූ පිළිවෙත් රකිනා බැවින් මහා සංඝ රත්නය,

1) සුපටිපන්න නම් වේ   2) උජුපටිපන්න නම් වේ   3) ආහුනෙය්‍යය නම් වේ 4) පාහුනෙය්‍යය නම් වේ

(39) "දානං සීලංච නෙක්ඛම්මං" යන ගාථාවෙන් විස්තර වන්නේ,

1) දාන පාරමිතාව පිළිබඳවයි   2) දස පාරමිතාව පිළිබඳවයි

3) දස සක්විතිවත් පිළිබඳවයි   4) දස පින්කිරියවත් පිළිබඳවයි

(40) බුදුරජාණන් වහන්සේ ගිජ්ජකූට පර්වතයේ සූකරකත ලෙනෙහි දී දේශනා කළ සූත්‍ර ධර්මය වන්නේ,

1) අම්බට්ට සූත්‍රයයි   2) මහාසීහනාද සූත්‍රයයි 3) වේදනා පරිග්‍රහ සූත්‍රයයි 4) සෝණදන්ඩ සූත්‍රයයි

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகமகல்விக்வலயம்மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

බුද්ධ ධර්මය II	11 ශ්‍රේණිය	කාලය :පැය 02 යි

★ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

★ **පළමු ප්‍රශ්නයට ලකුණු 20ක්ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමි වේ.**

(01) 1) බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනය සිදු කළ සූත්‍ර ධර්මය නම් කරන්න.

2) ත්‍රිලක්ෂණය නම් කරන්න.

3) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක මොනවාද?

4) බුදු දහමේ දැක්වෙන පරිදි සිත කිළිටි කරන අකුසල මූල තුන නම් කරන්න.

5) "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" මෙම පාඨයේ සරල අදහස ලියා දක්වන්න.

6) ආර්ය අෂ්ඨාංගික මාර්ගය ත්‍රිවිධ ශික්ෂාවට බෙදීමෙහි දී ප්‍රඥාවට අයත් මාර්ග අංග දෙක ලියන්න.

7) ලෝක පාලක ධර්ම නම් කරන්න.

8) සතර අගතිය නම් කරන්න.

9) සැරියුත් මුගලන් අගසව් දෙනම ගිහි කාලයේදී හැඳින්වූ නම් දෙක ලියන්න.

10) "සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්" යන උද්‍යෝග පාඨය ඉදිරිපත් කරමින් බුද්ධගයාව බේරා ගැනීමේ දැහැමි අරගලය ගෙන යනු ලැබුවේ කවුරුන් විසින් ද?

(02) බුදුරජාණන් වහන්සේගේ චරිතය නිර්මාණය වී ඇත්තේ අභියෝග රාශියක් ජයගත් ශාස්තෘවරයාණන් වහන්සේ ලෙසිනි.

i) එසේ උන්වහන්සේ ජයගත් අභියෝග 02ක් නම් කරන්න.

ii) උන්වහන්සේ අභියෝග ජයගත් ආකාරය කෙටියෙන් දක්වන්න.

iii) ශිෂ්‍ය ජීවිතය දියුණු කර ගැනීමේ දී ජයගත යුතු කරුණු රාශියකි. එම අභියෝග තුළින් ඔබගේ ජීවිතය සාර්ථක කරගන්නා ආකාරය විස්තර කරන්න.

(03) i) "සුකරානි අසාධූනී" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

ii) එම ගාථාවේ අදහස ලියා දක්වන්න.

iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට බුදුරජාණන් වහන්සේගේ මෙම දේශනාව කොතෙක් දුරට හේතුවන්නේ දැයි විස්තර කරන්න.

(04) i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන කරුණු අතුරින් 02ක් නම් කරන්න.

ii) ධාර්මිකව ධනය උපයන නිවරදි කර්මාන්ත ලෙස ධර්මයෙහි විස්තර වන කරුණු කෙටියෙන් හඳුන්වන්න.

iii) පුද්ගලයාගේ මෙලොව ජීවිතය සාර්ථක කර ගැනීම උදෙසා ඉහත කරුණු වැදගත්වන ආකාරය විස්තර කරන්න.

(05) i) දස පාරමිතා අතුරින් 04ක් නම් කරන්න.

ii) ත්‍රිවිධාකාර පාරමිතාව හඳුන්වන්න.

iii) පාරමී ධර්ම පුද්ගලයාගේ පමණක් නොව සමාජයේ යහපතට හේතුවන ආකාරය පැහැදිලි කරන්න.

(06) i) බුදුදහමේ සඳහන් කර්මය හඳුන්වන්න.

ii) විපාක දෙන කාලය අනුව කර්මය සතර අකාර වේ. ඉන් තුනක් නම් කරන්න.

iii) පුද්ගල විෂමතා හඳුනා ගැනීම තුළින් යහපත් සමාජ ජීවිතයක් ගත කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i) අනගාරික ධර්මපාලතුමා

ii) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි

iii) සමජීවිකතා

iv) මහින්දාගමනය